# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2012**
**2015 මාර්තු - මැයි**

**සමාජීය විද්‍යා පීඨය**

**ජනසන්නිවේදනය - MACO - E 2025**

**සංවර්ධනය, ජනමාධ්‍ය භාවිතය, ආයතන හා සංවිධාන**

**<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "ආර්ථික සංවර්ධනය මත සමාජීය සංවර්ධනය රඳා පැවතිය ද, සංවර්ධනය යනු ජීව ලෝකයේ යහපැවැත්ම සඳහා වන සාකල්‍යවාදී ප්‍රවේශයකි." පැහැදිලි කරන්න.

02. සංවර්ධනයේ දී සන්නිවේදනයේ ඇති අදාළත්වය න්‍යායික අදහස් මෙන් ම ප්‍රායෝගික උදාහරණ ඇසුරෙන් හඳුන්වා දෙන්න.

03. "නොයෙකුත් අංශ අතර සමබර ක්‍රියාකාරීත්වය ඔස්සේ අනාගත පරපුර සඳහා ස්වාභාවික සම්පත් මනාව කළමනාකරණය කිරීම නූතන සංවර්ධන කතිකාව සහ භාවිතාව තුළ අවධානයට ලක්ව තිබේ." විස්තර කරන්න.

04. සංවර්ධන වැඩසටහන්හි දී සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම මෙන්ම නව මාධ්‍ය ක්‍රම භාවිත කිරීමෙ හි ලා තිබෙන ශක්‍යතාව උදාහරණ ඇසුරෙන් දක්වන්න.

05. ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ආසියානු සංවර්ධන බැංකුව යන ආයතන ජාතික සංවර්ධන ව්‍යාපෘතීන් කෙරෙහි දක්වන බලපෑම කවරාකාර ද? විස්තර කරන්න.

06. ශ්‍රී ලංකාවේ උද්ගතව පවතින මෑතකාලීන සංවර්ධන ගැටලුවක් තෝරා ගෙන එයට උචිත සංවර්ධන සන්නිවේදන වැඩසටහනක් යෝජනා කරන්න.

07. සංවර්ධනයේ දී විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීමේ වැදගත්කම කවරාකාරද? සාකච්ඡා කරන්න.

08. **<u>එක්කෝ</u>**

1980 දශකයේ සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන කටයුතු තුළ දක්නට ලැබෙන සාධනීය හා නිශේධනීය බලපෑම් පිළිබඳ විවරණයක් කරන්න.

**<u>නැතහොත්</u>**

පහත සඳහන් මාතෘකා අතුරෙන් මාතෘකා හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. ප්‍රජා ගුවන් විදුලිය
2. ජංගම පෞරෂය සහ සහානුභූතිය
3. නවීකරණය හා ජනමාධ්‍ය
4. සංවර්ධනයේ දී තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ භාවිතාව
5. ප්‍රජා සංවර්ධනය සහ කුඩා-කණ්ඩායම් සන්නිවේදනය
6. නූතන සංවර්ධන කතිකාව

**************************